**රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය**

**ස්වදේශ කටයුතු අංශය**

**ප්‍රසම්පාදන දැන්වීමයි**

**" නිල මැදුර" ගොඩනැඟිල්ලේ මෙහෙයුම්, නඩත්තු හා අධීක්ෂණ සේවා සැපයීම වෙනුවෙන් ලංසු කැඳවීම**

රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයට අයත් ස්වදේශ කටයුතු අංශය, කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හා කොළඹ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය පිහිටි "නිල මැදුර" පරිපාලන සංකීර්ණයේ මෙහෙයුම්, නඩත්තු හා අධීක්ෂණ සේවා සැපයීම සඳහා රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය විසින් ලංසු කැඳවනු ලැබේ.

02. 2025.06.02 දින සිට 2025.06.20 දින දක්වා පෙ.ව 9.00 සිට ප.ව. 3.00 දක්වා ආපසු නොගෙවන රු.5,000/- ක ගාස්තුවක් ස්වදේශ කටයුතු අංශයේ, 16 වන මහලේ පිහිටි මූල්‍ය අංශයේ සරප් අංශය වෙත ගෙවා, ලබා ගන්නා වූ රිසිට්පත සමඟ රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් නමින් ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කිරීමෙන් පසු ප්‍රසම්පාදන ශාඛාවෙන් ලංසු ලියවිලි ලබාගත හැක. එකී සඳහන් කාල සීමාව තුළදී www.moha.gov.lk වෙබ් අඩවිය මඟින් ලංසු ලේඛණ පරීක්ෂා කිරීමේ අවස්ථාව සැපයුම්කරුවන් වෙත ලබා දී ඇත.

03. මුද්‍රා තබන ලද ලංසු "මුල් පිටපත" හා "අනු පිටපත" වශයෙන් පිටපත් දෙකකින් යුතුව වෙන වෙනම මුද්‍රා තබා සම්පූර්ණ කරන ලද ලංසු ලියවිලි බහාලන ලියුම් කවරයේ වම් පස ඉහල කෙළවරේ " **"නිල මැදුර" මෙහෙයුම්, නඩත්තු හා අධීක්ෂණ සේවාවන් සැපයීම සඳහා ලංසු කැඳවීම** " යනුවෙන් සඳහන් කර 2025.06.23 දින ප.ව.3.00 ට පෙර ලැබෙන ලෙස ලියාපදිංචි තැපැලෙන් හෝ "නිල මැදුර", ඇල්විටිගල මාවත, කොළඹ 05 පිහිටි ස්වදේශ කටයුතු අංශයේ 16 වන මහලේ මූල්‍ය අංශයේ ප්‍රසම්පාදන ඒකකයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීමෙන් ලංසු ඉදිරිපත් කළ හැක. ඔබ විසින් ඉදිරිපත් කරනු ලබන ලංසු 2025.10.20 දින දක්වා වලංගු විය යුතුය. ලියාපදිංචි තැපැලෙන් ලංසු ඉදිරිපත් කරන්නේ නම් පහත ලිපිනයට එවිය යුතුය. (ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ)

ගණකාධිකාරි (ප්‍රසම්පාදන),
ස්වදේශ කටයුතු මූල්‍ය අංශය
16 වන මහල,
නිල මැදුර,
ඇල්විටිගල මාවත,
කොළඹ 05.

04. ලංසු භාර ගැනීම අවසන් වූ වහාම නිල මැදුර ගොඩනැඟිල්ලෙහි 18 වන මහලේදී ප.ව.3.00 ට ලංසු විවෘත කරනු ලැබේ. ලංසු විවෘත කරනු ලබන අවස්ථාවට ලංසු කරුවන්ට හෝ ඔවුන් විසින් ලිඛිතව බලය පවරන අයෙකුට සහභාගි විය හැක.

වැඩි විස්තර සඳහා දුරකථන අංකය -011-2050412

**ලේකම්,**
**රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය**
**"නිල මැදුර",**
**ඇල්විටිගල මාවත,**
**නාරාහේන්පිට, කොළඹ 05**